# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 02

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY 10, 2010 මැයි මාසය (බුද්ධ වර්ෂ 2554 වෙසක් මාසය)
http://www.lankaheritage.com/lankaviththi/


## පාඨක ඔබ සැමට සුබ වෙසක් මංගල්‍යයක් වේවා!



නොහිම් දුක පිරුණු ලෝ සත හඬනු පෙනී
තරම් නැති ලෙසින් ඔහු සිත සසල වුනී
සිතුම් ලෙස සියළු සැප හැර ගියෙ සෙදිනී
උතුම් බුදු කෙනෙකු ඉන් ලොව පහළ වුනී

Having seen world's enormous suffering and vanity
He was disturbed and shaken to the extreme
Shedding kingly comfort, he fled, being attached to none.
Thus the world saw a **Buddha**, the most Supreme One.

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

### The Great Renunciation

**Just a moment before stealthily leaving the palace, in the middle of the night, Prince Siddhartha is having the last parting glance at his wife Yashodara and infant son Rahula.**

# නව රජය වැඩ අරඹයි

♦ **සංජය විමලරත්න විසිනි**

**2010** මහමැතිවරණය නියමිත පරිදි අප්‍රේල් 8 වෙනිදා පැවැත්වුණු අතර, මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් එක්සත් නිදහස් සන්ධානය විශිෂ්ඨ ජයක් ලැබීය. එම සන්ධානය ආසන **144** ක් ලද අතර, විපක්ෂයේ එක්සත් ජාතික පෙරමුණ ආසන **62** ක්ද, ද්‍රවිඩ ජාතික සන්ධානය ආසන **12** ක්ද, ජනතා විමුක්ති පෙරමුණ සරත් ෆොන්සේකා මහතා පෙරටුවට දමා ගෙන ආසන **7** ක් ද ලදහ.

මෙම ප්‍රථිඵල සහ එම ඡන්ද ව්‍යාපාරය ගැන එදා මෙදා වනතෙක් විශ්ලේෂණ රාශියක් කෙරී ඇති බැවින් ඒවා ගැන පුල පුලා ලිවීමෙන් පාඨක ඔබ වෙහෙසන්නට අවශ්‍ය නැත. අප්‍රේල් **22** දා නව පාර්ලිමේන්තුව රැස්විය. නව රජය ප්‍රකාශකොට තිබුණු ආකාරයටම ඊට පසුව දා නව ඇමති මණ්ඩලය දිවුරුම් දුන්නා ය.

## නව ඇමති මඬුල්ල

එක්සත් ජාතික නිදහස් සන්ධානය දී තිබුණු ඡන්ද පොරොන්දුවක් අනුව යමින් පසුගිය කාලයේ **109** ක් වූ ඇමතිවරුන් සංඛ්‍යාව අඩුකරලමින් එය **76** දෙනෙකුට බස්සවා තිබුණි. ඇමතිවරයෙකුගේ නඩත්තුව සඳහා රජය බැරකරන විශාල මුදල් සම්භාරය අනුව බලන විට මෙය විශාල ඉතිරියකි. එදා පැවති ඇමතිමඬුල්ල පසුගිය අවුරුදු කීපයක් විපක්ෂයෙන් රජය පැත්තට පිල් මාරු කළ පුද්ගලයින් රඳවා තබා ගැනීමට ඇමතිකම් ලබාදීමෙන් **යකා දත් හිටවන්නාක් මෙන්** අවස්ථාව අනුව ගොඩ නැගුණක් වීය. **2005** දී යාන්තමින් බලයට ආ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කෙසේ හෝ මෙලෙස පුද්ගලයින් රඳවා ගැනීමට සිදුවූයේ ඒ වන විට අරඹා තිබුණු කොටි ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය අවසානයක් දක්වා ගෙන යෑම සඳහාය. එසේ නොකරන්නට දේශීය හා විදේශීය සතුරන් මැද එම රජය බිඳ වැටුණේ නම් කොටි අද අප රට යට කරගන්නට පවා ඉඩ තිබුණි. කෙසේ හෝ එම විශාල ඇමති මඬුල්ල මේ ගණනට හෝ අඩුකර ගැනීම ද ලොකු ජයකි.

## ක්‍රමානුකූලව සැළසුණ ඇමති මඬුල්ලක්

රජය යම් ඉලක්ක අරමුණු කරගෙන මේ ඇමති මඬුල්ල ක්‍රමානුකූලව සැකසූ බව පෙනී යයි. පෙර ඇමති මඬුල්ලේ සිටි බොහෝ දෙනා මෙහිදී ද සිටි බැවින් ඒ අනුව පරණ **කාඩ් පැක්** එකම නැවත වෙන විදියකට පිළියෙල කිරීමක් සිදුව තිබේ. කිසිම අයෙකුට නැවත එම රාජකාරියම දී නොමැත. ජනාධිපතිතුමා ලද ප්‍රබල බලය නිසාදෝ එතුමා මේ අය යම් ප්‍රබල හස්තයකින් හසුරවන ලද බවක්ද සිතාගත හැකිය. එවැනි ආකාරයකින් මුල සිටම කටයුතු ඇරඹීම ඉදිරියට පටලැවිලි නැතිව කටයුතු කර ගෙන යාමකට පෙර ලකුණු පෙන්වයි.

නව ඇමති මණ්ඩලයේ ප්‍රධාන තම ස්ථානය ජනාධිපතිතුමාට හිමිවෙයි. ඔහු යටතේ වැදගත්ම අමාත්‍යාංශ දෙකක් වෙයි. ඒවා නම් ආරක්ෂක හා මුදල් යන අංශය. රටේ සංවර්ධන කටයුතු වසර **30** ක් පමණ අඩාල කළ කොටි ත්‍රස්තවාදය විනාශකරන ලදින් ඇතිවූ ස්ථාවර වාතාවරණය නැවත එවැනි කරදර වලින් ආරක්ෂාකර ගැනීමට එම කාර්යය ජනාධිපතිතුමා අතේම තිබීම අත්‍යවශ්‍යය. එසේම මුදල් සහ එය සමග සම්බන්ධිත ආර්ථික සැළසුම් කරණයද එතුමා යටතේ තිබීම වැදගත් වෙයි. ඒ සමගම ආර්ථික සංවර්ධනය යන නව අමාත්‍යාංශයද එතුමා යටතට එයි. එමගින් මුලු ඇමති මඬුල්ලම ඉලක්ක අරභයා නියම මග යන්නේ දැයි සොයා බැලීමේ බලය සහ වගකීමද එතුමා අත තිබේ. මේ සමග ජාතික ආර්ථික මණ්ඩලය (Natonal Economic Council) යන නව සංවිධානයද, ජනාධිපති තුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක මණ්ඩලයක් ද පිහිටුවා ඇත. මේවා ඇමති මණ්ඩලයේ කළමනාකරණයට සහාය සඳහා සැකසුණු නව උපකරණ වෙති.

## සංවර්ධනය අරමුණු කරගත් වැඩපිළිවෙලක්

නව අමාත්‍යාංශ පිහිටවූ තැන් සිටම ඒවා පෙරසේ නිකම්ම රටේ විවිධ පාලන අංශ ඇමතිවරුන්ට භාරකරලීමකට වඩා ඉක්මනින් ඉටු කළයුතු කාර්යභාරයන් සේ වේගවත් බවකට හරවා ඇත. අවශ්‍ය හා හැකි හැම තැනකම ඉදිරියට යෑමක් සඳහා කළ යුතු දේ අවධාරණය කරනු ලැබ ඇත. උදාහරණ කීපයක් ගතහොත් නිකම්ම සම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය අමාත්‍යාංශ වෙනුවට සම්ප්‍රදායී කර්මාන්ත සහ කුඩා


**4 වන පිටුව බලන්න** ➞





ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3